**සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය - 2013**
**------------------------------------------------------**

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1999 අංක 17 දරන සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරි පනතේ 9 (2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**
**-------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**
**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිති වලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. අචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුලත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**-----------------------------------------**

මෙම වාර්තාවෙ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ඉදිකිරීම් පහකට අදාළව ලබාදී තිබූ රු. 9,841,873 ක අත්තිකාරම් හා අත්තිකාරම් මත ගෙවූ එකතු කල අගය මත බදු රු. 277,242 ක් අනුචිත ලෙස කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම් ගත කර තිබුණි.

(ආ) අධිකාරියේ ගෘහස්ත ක්‍රීඩාංගණය, ශ්‍රී ලංකා පැසිපන්දු සංගමය වෙත වෙන්කරදීම වෙනුවෙන් ලැබිය යුතු රු. 1,507,764 ක ගාස්තුව වෙනුවෙන් ඉන්වොයිසියක් නිකුත් කර නොතිබුණු අතර, 2013 මූල්‍ය ප්‍රකාශන වලටද ගෙන නොතිබුණි.

(ඇ) 2013 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු එකතු කළ අගය මත බදු ප්‍රමාණය රු.44,370,072 ක් වූ අතර එයින් රු.33,252,709 ක් නැවත අයකර ගත නොහැකි බව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් තහවුරු කර තිබූ නමුත් ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කිරීම් හෝ හෙළිදරව් කිරීම් කර නොතිබුණි.

**2.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) **2013** දෙසැම්බර් 31 දිනට වසර 5කට වඩා කල් ඉකුත් වූ රු.34,865,252 ක් වූ වෙළඳ ණයගැති ශේෂය හා රු. 22,410 ක් වූ ඇප තැන්පත් ශේෂය සහ වසර 2 සිට වසර 4 දක්වා පැරණි රු. 2,416,804 ක් වූ ලැබිය යුතු රඳවා ගැනීම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණ අතර වසර 2 කට වඩා කල් ඉකුත් වූ රු. 702,981 ක් වූ කොන්ත්‍රාත් රඳවාගත් මුදල් හා රු. 215,293 ක් වූ වෙළඳ ණයහිමි ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ක්‍රීඩා සංගම් හා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් අධිකාරියට අයවිය යුතු ලෙස දක්වා ඇති පහත සඳහන් ශේෂයන්, එම ආයතන වල මූල්‍ය ප්‍රකාශන සමඟ පරීක්ෂා කිරීමේ දී, වෙනසක්ම් නිරීක්ෂණය වුයෙන්, එකී අයවිය යුතු ශේෂ වල නිරවද්‍යතාවය තහවුරු කරගත නොහැකි විය.

| ආයතනය | 2013.12.31 දිනට ශේෂය<br>අධිකාරියේ ගිණුම අනුව -ශේෂය | අදාළ ආයතනයේ ගිණුම අනුව ශේෂය |
|---|---|---|
| | රු. | රු. |
| දුනු විදීමේ සම්මේලනය | 222,091 | නැත |
| ජාතික ඔලිම්පික් කමිටුව | 611,188 | නැත |
| ශ්‍රී ලංකා වොලිබෝල්සම්මේලනය | 2,344,757 | නැත |
| ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | 1,562,869 | 59,227 |

**2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

ගිණුම්වල දැක්වෙන පහත දැක්වෙන විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොවීම් හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස පිළිගැනීමට නොහැකි විය.

| | විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | කොළඹ නගර සභාවට ගෙවිය යුතු ශේෂය | 1,124,068 | උපලේඛණ හා ශේෂ තහවුරු කිරීම් |
| (ආ) | නොගෙවන ලද ශේෂයන් | 216,593 | උපලේඛණ |
| (ඇ) | කලින් ලද ආදායම | 139,449 | ආදායමට අදාල තොරතුරු |
| (ඈ) | ආපසු ගෙවිය යුතු තැන්පතු | 3,925,338 | කාල විශ්ලේෂණ |
| (ඉ) | වෙළඳ ණයගැතියෝ | 40,999,600 | ශේෂ සනාථ සහතික |
| (ඊ) | වෙළඳ ණයහිමියෝ | 608,419 | ශේෂ සනාථ සහතික |

**2.2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xix වැනි පරිච්ඡේදයේ 5.3.1 වගන්තිය | උපලේඛන ගත නිවාසයක පදිංචි නිලධාරියෙකුගේ නිල නිවාස කුලිය ලෙස ඔහුගේ වැටුපෙන් සියයට 10 ක් අයකරගත යුතු වුවද, අධිකාරිය විසින් කිසිදු අයකිරීමකින් තොරව සභාපති නිල නිවාස අධ්‍යක්ෂ වෙත ලබාදී තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | (i) මුදල් රෙගුලාසි. 110 | පාඩු හා හානි ලේඛනයක් පවත්වා නොතිබුණි. |

(ii) මුදල් රෙගුලාසි. 754 – මුදල් වර්ෂයක් අවසානයේදී, බඩු වට්ටෝරු පොත් තුලනය කර යාවත්කාලීනව පවත්වාගෙන යායුතු වුවත්, අධිකාරිය විසින් එලෙස පවත්වාගෙන ගොස් නොතිබුණි.

(iii) මුදල් රෙගුලාසි. 755(1) – සෑම ගබඩාභාරකරුවකු නැතහොත් යම් යම් භාණ්ඩවල හා වෙනත් රජයේ දේපල වල භාරය පැවති ඇති ඕනෑම නිලධාරියෙකු, සිය රාජකාරි අතහැරීමට, මාරුවක් ලැබ යාමට නැතහොත් දීර්ඝ නිවාඩුවක් ලැබ යාමට පෙර, ඔහු විසින් ඔහුගේ අනුප්‍රාප්තිකයාට හෝ එම කාර්යය පවරනු ලැබ සිටින වෙන ඕනෑම නිලධාරියෙකුට හෝ තම වගකීම යටතේ ඇති සියලුම රජයේ භාණ්ඩ හා වෙනත් දේපල බාර දී ඒවා බාර දෙන නිලධාරියාගෙන් ඒවා ලැබුණු බවට පිටපත් දෙකකින් යුක්ත කුවිතාන්සියක් ලබාගත යුතු වුවත්, අධිකාරියේ නිලධාරින් එසේ ක්‍රියාකර නොතිබුණි.

(ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

(i) 5. 1.2 ඡේදය – ක්‍රියාකාරී සැලැස්මෙහි එක් එක් කාර්යයන් සඳහා වගකිවයුතු නිලධාරින් හඳුනාගෙන නොතිබුණි.

(ii) 5.1.3 හා 5.2.1 ඡේද – අනුමත වාර්ෂික අයවැය ලේඛනය වර්ෂය ආරම්භ වීමට දින 15කට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම හා එම අයවැය ලේඛනය, ක්‍රියාකාරී සැලැස්ම සමඟ ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තු ඉදිරිපත් කල යුතු වුවත් ආයතනය ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඈ) 2002 නොවැම්බර් අංක අයිඒඅයි/1/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය – පරිගණක හා මෘදුකාංග සඳහා වෙනම ලේඛනයක් පවත්වා නොතිබුණි.

(ඉ) 2006 මාර්තු 01 දිනැති ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.1.1 (අ) වගන්තිය – බෝගම්බර ක්‍රීඩාංගණය සඳහා මිල දී ගෙන ඇති රු. 2,022,849 ක් වටිනා උපකරණ මිල දී ගැනීමට අදාළව ලංසු කැඳවීමේ ලේඛන අධිකාරිය විසින් සකස් කර නොතිබු අතර ලංසු සුරක්ෂණද ලබා ගෙන නොතිබුණි

**2.2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ ආරක්ෂක වැට සහ ප්‍රධාන ගේට්ටුව අලුත්වැඩියා කිරීම සඳහා 2013 ඔක්තෝබර් සහ නොවැම්බර් මාසවලදී මිල දී ගෙන තිබු රු.507,409 ක් වටිනා යකඩ සහ අනෙකුත් ද්‍රව්‍ය ඉහත කාර්යයන් සඳහා භාවිතයට නොගෙන, එළිමහන් ක්‍රීඩාංගණයේ අබිලි ද්‍රව්‍ය ගබඩාවේ ගොඩගසා තිබුණි.

**3.** **මූල්‍ය සමාලෝචනය**
----------------------

**3.1** **මූල්‍ය ප්‍රතිඵල**
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.71,210,496 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.81,984,071 ක් වීමෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.10,773,575 ක වර්ධනයක් දක්නට ලැබුණි. මේ සඳහා ඉකුත් වර්ෂයට සාපේක්ෂව රජයේ ප්‍රදාන රු.18,400,000 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**4.** **මෙහෙයුම් සමාලෝචනය**
-----------------------------

**4.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**
-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සුගතදාස ක්‍රීඩා සංකීර්ණ අධිකාරියට අයත් ආර්. ප්‍රේමදාස ක්‍රීඩාංගනය ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට 2006 වර්ෂයේ සිට, බදු ගිවිසුමක් යටතේ භාරදී තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදී එම ක්‍රීඩාංගනය භාරයේ ඇති අධිකාරියට අයත් රු.2,149,491 ක තොග භෞතික සත්‍යාපනයකින් තොරව ගිණුම්වල ඇතුළත් කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී අධිකාරිය විසින් රු.190,000 ක් වැය කර මිලදී ගෙන තිබූ ඇඟිලි සලකුණු කිරීමේ යන්ත්‍ර 4 ක්, අක්‍රීය වීම හේතුවෙන්, භාවිතයෙන් ඉවත් කර තිබුණි.

(ඇ) 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතට අනුව පාරිතෝෂික දීමනා සේවකයා ඉවත් වී මාසයක් තුළදී ගෙවිය යුතු වුව ද, ඊට අනුකූලව කටයුතු නොකිරීම නිසා අධිභාර වශයෙන් රු. 46,918 ක් ගෙවීමට සිදු වී තිබුණි.

(ඈ) අධිකාරියට අයත් ක්‍රීඩා හෝටලය 2010 නොවැම්බර් 15 දින සිට වර්ෂ 3ක කාලයක් සඳහා රු.9,120,000ක වාර්ෂික කුලියකට ලබාදී තිබූ අතර 2011මාර්තු 23 දින අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉහත කුලී ගිවිසුම අවලංගු කර ක්‍රීඩා හෝටලය අධිකාරියේ කළමනාකරණය යටතට ගෙන තිබුණි. කෙසේ වුවද, අධිකාරියේ කළමනාකරණය යටතේ 2011, 2012 හා 2013 වර්ෂ වලදී ක්‍රීඩා හෝටලයේ ශුද්ධ ලාභය, වාර්ෂික කුලි ආදායම සමඟ සැසඳීමේදී පිළිවෙලින් රු. 6,001,547, රු. 4,167,772 හා රු. 4,672,424 කින් ආදායම අහිමි වී තිබුණි.

**4.2** **මතභේදයට තුඩුදෙන ගනුදෙනු**
-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරිය විසින් බෝගම්බර ක්‍රීඩාංගණය සඳහා කිලෝ වොට් 6 ක ස්ටීම් ජෙනරේටර් 2 ක්, බුෂ් කට(ර්) 3 ක් සහ වැකුම් ක්ලීන(ර්)යක් පිළිවෙලින් රු.559,776 ක්, රු.179,850 ක් හා රු.91,915 ක් වැයකර මිලදීගෙන තිබුණි. අවස්ථා තුනේදීම අවම ලංසුව ඉදිරිපත් කර තිබූ ආයතනය තෝරා නොගෙන නියමිත පිරිවිතරයන්ට අනුකූලව භාණ්ඩ ඉදිරිපත් කර නොතිබූ ආයතන වලින් භාණ්ඩ මිල දී ගෙන තිබුණි.

(ආ) 2013 දෙසැම්බර් 23 දින සිට 30 වෙනි දින දක්වා කොළඹ සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ පැවති 3 වෙනි ආසියානු කාන්තා 16 න් පහළ බාස්කට් බෝල් තරඟාවලිය සඳහා ප්‍රසම්පාදන කමිටු නිර්දේශ මත මිලදී ගෙන තිබූ රු.3,625,000 ක් වටිනා පැසිපන්දු උපකරණ අදාල වෙළඳ නාමයන්ට අනුකූල උපකරණද යන්න තහවුරු නොවුණි. තවද ප්‍රමාණවත් කාලයක් තිබියදී තරගකාරී මිල

කැඳවීමකින් තොරව හදිසි අවශ්‍යතාවයක් සේ සලකා, සීමිත මිල ගණන් කැඳවා මිලදී ගැනීම සිදු කර තිබුණි.

**4.3 අරමුදල් ඌන උපයෝජනය**

-------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට 2008 සහ 2012 වර්ෂ වල එකතුව රු.24,919,800 ක මුදලක්, ස්ථාවර තැන්පතු වල ආයෝජනය නොකර, සත් දින තැන්පතු වල ආයෝජනය කර තිබුණි.

**4.4 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

--------------------------------------

ගබඩාවේ තොගය සම්බන්ධයෙන් 2014 සැප්තැම්බර් 12 දින කරන ලද භෞතික පරීක්ෂාවේ දී රු.573,214 ක පිරිවැය වූ භාණ්ඩ නිශ්ක්‍රීයව පැවති අතර ඉන් රු.100,712ක් පිරිවැය වූ භාණ්ඩ කල් ඉකුත් වී තිබුණි. තවද රු.154,075 ක් පිරිවැය වූ භාණ්ඩ තොගයක් ඌන උපයෝජිතව පැවතුණි.

**4.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ එළිමහන් ක්‍රීඩාංගණය, ගෘහස්ත ක්‍රීඩාංගණය සහ ක්‍රීඩා හෝටලය පිරිසිදු කිරීමේ කොන්ත්‍රාත් ගිවිසුම අනුව ගිවිසුමේ සඳහන් සේවක සංඛ්‍යාවට වඩා අඩුවෙන් සේවකයින් සේවයේ යොදවන විට ගෙවීම් කිරීමේදී මාසික කොන්ත්‍රාත් මුදලින් අඩු කරගත යුතු සියයට 5 ට අදාල රු. 270,892 ක් අඩුකරගෙන නොතිබුණි.

**(ආ) ටෙනිස් පිටිය හා පැසිපන්දු පිටිය අලුත්වැඩියාව - රු. 1,935,819**

-----------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) අධිකාරියේ එළිමහන් ක්‍රීඩාංගණයේ පිහිටි ටෙනිස් පිටිය හා පැසිපන්දු පිටිය අලුත්වැඩියා කිරීම සඳහා පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කිරීමෙන් තොරව කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබූ රු. 1,935,819 ක ප්‍රමාණ පත්‍රයක් පදනම් කරගෙන කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.

(ii) 2013 දෙසැම්බර් 12 දින වනවිට ටෙනිස් පිටිය හා පැසිපන්දු පිටිය වැඩිදියුණු කිරීමේ කොන්ත්‍රාත්තුවේ වැඩ සියයට 98 ක් පමණ නිමකර තිබීමේ පදනම මත කොන්ත්‍රාත්කරුට රු.1,726,902 ක් ස්ථාවර තාක්ෂණ කමිටු අනුමැතියකින් තොරව, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ඉංජිනේරුගේ නිර්දේශය හා අනුමැතිය මත පමණක් ගෙවා තිබුණි. තවද කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව කොන්ත්‍රාත්තුව 2013 දෙසැම්බර් 02 දින වන විට නිමකළ යුතු වුවද නිමකර තිබුණු වැඩ කොටස් නිසි ප්‍රමිතියකින් ඉටුකර නොතිබුණි. අධිකාරියේ සභාපතිවරයා විසින් අධ්‍යක්ෂ ඉංජිනේරු අමතන ලද 2014 මාර්තු 28 දිනැති අංක 04/ 03/ 03(13) 2013 දරන ලිපිය මඟින්ද කොන්ත්‍රාත්තුවේ වැඩ නිම වී නොමැති බව තහවුරු කර තිබුණි.

(iii) වැඩ නිමකර තිබූ ටෙනිස් පිටිය පුහුණු කටයුතු සඳහා භාවිතයට ගෙන නොතිබුණි. තවද අලුත්වැඩියා කර කෙටි කාලයක් තුල II වන අදියර ලෙස රු.79,211,330 ක ඇස්තමේන්තුවකට පැසිපන්දු පිටි සංකීර්ණයක් ඉදිකිරීමට සැලසුම් කිරීම හේතුවෙන් පළමු අදියරේදී දරා තිබූ වියදම නිෂ්කාර්ය වියදමක් විය හැකි බව නිරීක්ෂණය විය.

**4.6 ප්‍රමාද වූ ව්‍යාපෘති**

**-------------------**

අධිකාරිය 2013 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ ප්‍රාග්ධන ව්‍යාපෘති 08 ක් වෙනුවෙන් රු.මිලියන 61.3 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද, 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති වල මූල්‍ය කාර්යසාධනය සියයට 1 සිට සියයට 60 දක්වා විය.

**4.7 කාර්ය මණ්ඩල පරිපාලනය**

**------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තනතුරක් පුරප්පාඩු වන සෑම අවස්ථාවකදීම අදාළ පුරප්පාඩුව පිරවීම සඳහා මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවත්, අදාල අනුමැතිය ලබා ගැනීමෙන් තොරව අධිකාරියේ පැවති පුරප්පාඩු 08 ක් පිරවීම සඳහා 2013 වර්ෂයේදී බඳවා ගැනීම් සිදු කර තිබුණි.

(ආ) කාර්යාල කාර්ය සහායක තනතුරු 08 ක් සඳහා අභ්‍යන්තර සේවකයන්ගෙන් අයදුම්පත් කැඳවා තිබූ අතර, අයදුම්පත් එවිය යුතු අවසාන දිනට පසුව අයදුම්පත් ඉදිරිපත් කර තිබූ අයදුම්කරුවන් හතරදෙනකු අදාල තනතුරුවලට බඳවාගෙන තිබුණි. තවද බඳවාගත් 08 දෙනාගෙන් 04 දෙනෙකු බාහිර අයදුම්කරුවන් විය.

(ඇ) ආරක්ෂක නියාමක සහ ක්‍රීඩාංගණ සහායක තනතුරු වලට බඳවාගෙන තිබූ නිලධාරීන් 36 දෙනෙකු අදාළ රාජකාරි වලින් බැහැර වෙනත් රාජකාරී සඳහා අනුයුක්ත කර තිබුණි. තවද අදාළ නිලධාරින් සඳහා කාර්ය පැවරුම් ලිඛිතව ලබාදී නොතිබීම හේතුවෙන් ඔවුන්ගේ සේවය තහවුරු කර ගැනීමට සාක්ෂි නොවීය.

(ඈ) තනතුරු වලට අදාළව අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා වෙනත් තනතුරු වලින් නිලධාරීන් අනුයුක්ත කර තිබීම හේතුවෙන්, තනතුරු 05 කට අදාළව අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සේවකයින් 24 දෙනෙක් සේවය කරන බව නිරීක්ෂණය විය.

(ඉ) ගබඩා භාරකරු තනතුර සඳහා බඳවා ගෙන තිබූ අයදුම්කරු මූලික සුදුසුකම් සපුරා නොතිබූ අතර ඔහුට සේවා පළපුරුද්දක්ද නොවීය. තවද අදාළ තනතුර සඳහා ඉදිරිපත් කර තිබූ අනෙකුත් අයදුම්පත්ද සම්මුඛ පරීක්ෂණ වාර්තාවන්ද විගණනය සඳහා ඉදිරිපත් නොවීය.

(ඊ) අධිකාරියේ අනුමත කාර්යය මණ්ඩලයේ නොමැති කායවර්ධන උපදේශක තනතුර සඳහා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතියක් ලබා නොගෙන බෝගම්බර කාය වර්ධන මධ්‍යස්ථානය සඳහා 2013 වර්ෂ වෙනුවෙන් කායවර්ධන උපදේශකවරු 3 ක් බඳවා ගෙන තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**-----------------------------------------**

**5.1 අභ්‍යන්තර විගණනය**

**-------------------------**

සමාලෝචිත වර්ෂයට අදාළ අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව ක්‍රියාත්මක කර තිබූ විගණන විෂයයන් හා සැසඳීමේදී සැලසුම් කර තිබූ පරිදි විගණනය ක්‍රියාත්මක කර නොතිබුණි.

**5.2 අයවැය ලේඛනමය පාලනය**

**------------------------------**

2003 පෙබරවාරි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2 ඡේදය ප්‍රකාරව, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනය විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර නොතිබුණි.

6. **පද්ධති හා පාලනයන්**

**--------------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) වත්කම් කළමනාකරණය
(ආ) ගිණුම්කරණය
(ඇ) මානව සම්පත් කළමනාකරණය
(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඊ) තොග පාලනය
(උ) අයවැය පාලනය
(ඌ) ආදායම් පරිපාලනය